මිහින්තලය ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 21 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 10 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 අහිතකර මතය

මෙම වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මිහින්තලය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 අහිතකර මතය සඳහා පදනම

(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංසන්දනාත්මක ගිණුම් ඉදිරිපත් කිරීමේදී පෙර වර්ෂයේ ඌනතාවය රු.2,560,205 ක් වුවද එය රු.12,730,178 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි. |

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ රු.3,161,025 ක් වූ උසාවි දඩ ආදායම් සහ මුද්දර ගාස්තු ආදායම්,ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර වියදම් ශීර්ෂය යටතේ වියදම් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාල රු.2,500,800 ක කඩකුලී බිල්කල ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු.1,428,400 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.1,072,400 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේ ටෙන්ඩර් දේපල බදුදීම් බිල්කිරීම් ආදායම රු.1,309,250 ක් වුවද මුල්‍ය ප්‍රකාශනවල රු.1,751,006 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.441,756 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |
| (iv) | 2020 වර්ෂයට අදාල ටෙන්ඩර් බදුදීම් සඳහා සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.1,042,985 ක් වගකීම් ලෙස මුල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |
| (v) | සමාලෝචිත වර්ෂයට අදාල රු.344,225 ක් වූ දැන්වීම් පුවරු ආදායම මුල්‍ය ප්‍රකාශනවල රු.373,025 ක් ලෙස දක්වා තිබීම නිසා රු.28,800 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ දැන්වීම් පුවරු ආදායම් රු.356,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ කසළ ගාස්තු බිල්කල ආදායම රු.948,847 ක් මුල්‍ය ප්‍රකාශනවල රු.1,677,541 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.728,694 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 83 ක් වෙනුවෙන් ලැබිය යුතු සහ ගෙවිය යුතු කර්මාන්ත ණයගැති සහ ණයහිමි ශේෂය රු.19,870,227 ක් ප්‍රාග්ධන ආදායම් සහ වියදම් ලෙස දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |
| (viii) | සතිපොල ඉදිකිරීම් අතරුදවුම් රු.1,138,441 ක් නිදහස් කර තිබුණු නමුත් එම ගෙවීම් වටිනාකම බැංකු ගිණුමේ ශේෂයෙන් පමණක් අඩුකර මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතුවේ. | පිළිගනිමි. |
| (ix) | විවිධ ණයහිමි ගිණුමේ පෙර වර්ෂයේ ණයහිමි ගෙවීම් රු.90,091 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු රු.78,806 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |
| (x) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත වෙනුවෙන් ගෙවීම් සඳහා පොදු ගිණුමෙන්, කර්මාන්ත ගිණුමට මුදල් මාරු කිරීම් රු.1,074,625 ක් වෙනත් ආදායම් ලෙසද මුදල් පියවීම් රු.656,625 ක් පොදු පරිපාලන වියදම් ලෙසද දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (xi) | ඇප තැන්පත් සහ පොදු තැන්පත් වෙනුවෙන් ලැබීම් රු.370,025 ක් වගකීමක් ලෙස දැක්වීම වෙනුවට වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |
| (xii) | දෙසැම්බර් මස සෞඛ්‍ය සේවා වැටුප් සහ වේතන මුළු වියදම රු.387,627 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.578,609 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.190,982 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |
| (xiii) | ගම්පෙරළිය ව්‍යාපෘතිය වෙනුවෙන් මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු පරිපාලන වියදම් රු.521,950 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කළයුතුව තිබුණු රැඳවුම් බදු සහ මුද්දර බදු රු.105,539 ක් සමුච්චිත අරමුදලට ගැලපුම් කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වටිනාකම රු.143,826,950 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ රු.82,212,276 ක්වූ ආදායම් විෂයයන් 18 කට අදාල වටිනාකම් සහ රු.87,892,734 ක් වූ වියදම් විෂයයන් 09 කට අදාල වටිනාකම් ලෙජරයේ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයට මාරුකිරීමට අදාල ජ'නල් සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | ජ'නල් සටහන් ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,812,837 ක් වූ ආදායම් විෂයයන් 09 කට අදාල වර්ෂයේ ආදායම් ලේඛන හා ආදායම් ලැබීම් උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | ආදායම් ලේඛන හා උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ. | ලේඛන සියල්ල යාවත්කාලීන වී ඇති අතර, අතපසුවීමකින් ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. |

1.4 අනුකූල නොවීම්

---------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා ( මුල්‍ය හා පරිපාලන ) රීති සංග්‍රහය | | | | |
| | (i) රීති 161 | | පී.එස් 17 ආකෘතිය ප්රකාර ආදායම් වියදම් ගිණුම ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| | (ii) රීති 217 හා 218 | | සභාව සතු ඉඩම් ගොඩනැගිලි සම්බන්ධයෙන් P.S.46 ආකෘතිය ප්‍රකාර ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක්ම පරික්ෂාකර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ආ) | මෝටර් වාහන පනත 203 අධිකාරිය | - | සභාව සතු ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක්, අත් ට්‍රැක්ටරයක් හා ජල බවුසර 02 ක් ලියාපදිංචි කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | 2008 අංක 13 දරන ගෝඝාතන (සංශෝධන) පනත - 272 අධිකාරියේ 18 වගන්තිය | - | කටුකැලියාව ප්‍රදේශයේ පෞද්ගලික ස්ථානයක පවත්වාගෙන යන අදාල ගව ඝාතකාගාරය සඳහා බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම දේපළ සභාවට පවරා ගැනීමට නොහැකිවීම මත බදුදීමට නොහැකිවී ඇත. |

(ඇ) උතුරු මැද පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ

-----------------------

| | | | | | |
|---|---|---|---|---|---|
| 2002 ජූලි 24 දිනැති අංක 20/2002 හා 2015 ජනවාරි 13 දිනැති 20/2002(i) චක්‍රලේඛය | 39,525 | (i) | ඉඩම් අනුබෙදුම්, වීථිරේඛා, ගොඩනැගිලි සැලසුම් සඳහා අයකරන පරීක්ෂණ ගාස්තුවෙන් ගෙවිය හැකි දිරි දීමනාව 50% ක් වුවද 2018 හා 2019 වර්ෂ සඳහා අයකළ සම්පූර්ණ පරීක්ෂණ ගාස්තුව දිරිදීමනා ලෙස ගෙවීම් කර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභා තීරණයක් මත කටයුතු කර ඇති බව දන්වා සිටින අතර 2019.10.29 දින සිට 2002.07.24 පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අංක 20/2002 දරන චක්‍රලේඛය අනුව කටයුතු සිදුකර ඇති බව දන්වා සිටිමි. |
| | 39,705 | (ii) | ක්ෂේත්‍ර පරීක්ෂණ වලට සහභාගීවන නිලධාරීන්ට පමණක් අදාල දීමනාව ගෙවිය හැකි වුවද 2018 හා 2019 වර්ෂවල ඊට සහභාගී නොවූ පාර්ශ්වයන්ට ද දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභා තීරණයක් මත කටයුතු කර ඇති බව දන්වා සිටින අතර 2019.10.29 දින සිට 2002.07.24 පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අංක 20/2002 දරන චක්‍රලේඛය අනුව කටයුතු සිදුකර ඇති බව දන්වා සිටිමි. |

02. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,650,387 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,560,205 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම් | 2019 බිල්කල ආදායම | 2019 රැස්කල ආදායම් | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කල ආදායම | 2018 රැස්කල ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 948,500 | 1,177,050 | 1,177,050 | - | 968,750 | 1,191,830 | 983,210 | 480,820 |
| (ii) | කුලී | 12,201,430 | 9,070,591 | 7,538,474 | 2,444,991 | 10,351,048 | 11,157,048 | 10,866,816 | 912,877 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 3,492,500 | 3,928,766 | 3,928,776 | - | 3,783,552 | 17,506,500 | 17,506,500 | - |
| (iv) | වෙනත් ආදායම් | 2,068,000 | 3,666,708 | - | 8,677,405 | 1,789,800 | 1,325,166 | 5,595,844 | 5,010,697 |
| | | 18,710,430 | 17,843,115 | 12,644,300 | 11,122,396 | 16,893,150 | 31,180,544 | 34,952,370 | 6,404,394 |

## 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(i) වගන්තිය ප්‍රකාර සභා බල ප්‍රදේශයේ සංවර්ධිත ප්‍රදේශ ප්‍රකාශයට පත්කර, වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සංවර්ධිත ප්‍රදේශ ගැසට් කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | මේ වනවිට වරිපනම් සීමාව හඳුනාගෙන සිතියම්ගත කොට මහසභාව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගෙන ඇත. ඊට අදාළ නිර්ණායකයන් සකසා පළාත් පාලන දෙපර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. |

## 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව යටත් පිරිසක් වසර 5 කට වරක්වත් කඩ කාමර තක්සේරු සංශෝධනය විය යුතු වුවද කඩකාමර 41 ක 2009 වර්ෂයේ තක්සේරුව පදනම්ව සමාලෝචිත වර්ෂයේ කුලී අයකර තිබුණි. | නව තක්සේරුව මත කුලී අයකිරීමට කටයුතු කළ යුතුවේ. | ලබාගත් තක්සේරු වාර්තාව මගින් ලබා දී ඇති මාසික කඩකුලී තක්සේරු මුදල් අයකිරීම සම්බන්ධව කඩ කාමර බදුකරුවන් දැනුවත් කිරීමේදී එම මුදල ගෙවීම බදුකරුවන් විසින් ප්‍රතික්ෂේප කරන ලදී. |
| (ආ) | කඩකාමර 36 කින් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කඩකුලී ප්‍රමාණය රු.1,277,156 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | එම හිඟ කඩ කුලී මුදල් අයකර ගැනීම සඳහා ගරු දිසා අධිකරණය වෙත කරුණු වාර්තාකර නෙරපීම් නියෝග ලබා ගැනීමට මේ වනවිට කටයුතු කරමින් පවතී. |

2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති 59-66 දක්වා රීති ප්‍රකාරව වෙළඳ බලපත්‍ර, කර්මාන්ත බදු, වෘත්තිය බදු අයකල යුතු ආයතන සම්බන්ධව සමීක්ෂණයක් කර නොතිබුණි. | රීති ප්‍රකාරව සමීක්ෂණ පවත්වා ගාස්තු අයකළ යුතුවේ. | පිළිගනිමි. |

2.2.5 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 සිට 2019 දක්වා වර්ෂවලට අදාල මුද්දර ගාස්තු ප්‍රධාන ලේකම් වෙතින් නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2017, 2018 වර්ෂ සඳහා ලැබිය යුතු ලෙස හඳුනාගත් රු.2,821,534 මුදල ද ඇතුළුව 4,434,484 ක මුදලක් මුද්දර ගාස්තු ලෙස 2020.03.12 දින සභාව වෙත ලැබුණි. 2019 වර්ෂය සඳහා මුද්දර ගාස්තු ගණනය කිරීම සඳහා මෙතෙක් ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාලයෙන් කැඳවීමක් ලැබී නැත. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වු නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අදාල කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුවේ. | එම සියළු කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නැත. සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඒ අනුව කටයුතු කරනු ලබයි. මේ වනවිට අතුරු ව්‍යවස්ථා සම්පාදන කමිටුවක් පත්කර ඒ අනුව ඉදිරියේදී අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සම්පාදනයන් සිදුකරනු ඇත. |

(ආ) අත්හැර දැමූ කර්තව්‍යයක්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී අනුමත වූ රු.6,970,000 ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත කර්තව්‍යන් 06 ක් වර්ෂය තුළදී ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි. | වර්ෂයේ අනුමත ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළ යුතුවේ. | අවිච්ඡේද ව්‍යාපෘති ලෙස 2020 වර්ෂයේ ඉටු කරමි. |

(ඇ) කර්තව්‍යයක් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ රු.2,405,145 කට ගිවිසුම්ගත වී වර්ෂය තුළදී නිම කළයුතු කර්තව්‍යන් 03 ක් ඉටුකිරීමේ ප්‍රමාදයන් අනාවරණය විය. | ගිවිසුම් කාලය තුළ ව්‍යාපෘති ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි.<br>අදාළ කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇත. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඝන අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳව විධිමත් ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් රැස්කරන කැලිකසළ වර්ග කිරීමෙන් තොරව විවෘත භූමියක වලදැමීම සිදුකර තිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව සිදුකිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉඩමක් වෙන්කර දීමෙන් පසුව මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය සමඟ එක් වී විධිමත් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමටත්, ඒ තුළින් විධිමත් කසළ කළමනාකරණයක් සිදු කිරීමට බලාපොරොත්තු වෙමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | මේ සඳහා විධිමත් දැනුමක් සහිත නිලධාරියෙකු සභා කාර්ය මණ්ඩලයේ නොමැත. එහෙයින් සුදුසු නිලධාරියෙකු දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කිරීමට සැලසුම් කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බාහිර කාර්යයන් සඳහා සභාවේ යන්ත්‍ර සහ ගලි බවුසරය යෙදවීම වෙනුවෙන් අයවිය යුතු රු.202,000 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | යන්ත්‍ර සහ ගලි බවුසරය කුලී පදනම මත යෙදවීමට පෙර ගාස්තු අයකර ගැනීමේ ක්‍රමවේදයක් සැකසිය යුතුවේ. | සභාපති/උපසභාපති හා මන්ත්‍රීවරුන්ගේ උපදෙස් මත යන්ත්‍ර අදාළ කාර්යන්වල යොදා ඇත. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ආ) | පුස්තකාලය හා ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් 2011 වර්ෂයේ රු.11,996,091 ලබාගෙන තිබු නමුත් අදාල ශ්‍රවණාගාරය ඉදිකර නොතිබුණි. | ණය මුදල් ලබාගත් අරමුණු ඉටුකර ගත යුතුවේ. | මෙම ඉදිකිරීම් බොහෝ කලකට පෙර දේශීය ණය සහ සංවර්ධන අරමුදල් දායකත්වය මත සිදුකර ඇත. එහෙත්, එම ගොඩනැගිල්ලේ සම්පූර්ණ ඉදිකිරීම් සිදුකර නොමැත. දැනට ඉදිකර ඇති ගොඩනැගිල්ලේ මහජන පුස්තකාලය, ගබඩාව හා කාර්යාලීය වෙනත් කටයුතු සඳහා භාවිත කරනු ලබයි. ඉහළ මාලයේ ඉදිකිරීම් සිදුකිරීමට ඇත. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රු.1,283,500 ක් වටිනා යතුරු පැදියක්, රෝද දෙකේ ට්‍රැක්ටරයක්, ගල් රෝලක් සහ ඩබල් කැබ් රථයක් වසර 5 ක පමණ කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | වත්කම් අළුත්වැඩියා කර භාවිතා කිරීම හෝ අපහරණය කිරීම සිදුකළ යුතුවේ. | 147-7729 යතුරුපැදිය වෙන්දේසි කලත් එය කිසිවෙකුත් මිළදී නොගත් අතර, 53-5046 කැබ් රථය භාවිතයට ගත නොහැකි මට්ටමට අබලන්ව ඇත. කුඩා ගල් රෝල හා රෝද දෙකේ ට්‍රැක්ටරය ලැබී ඇති මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් මගින් අලුත්වැඩියා කිරීමට කටයුතු කරමි. |

### 3.3.2 වත්කම් ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1980 වර්ෂයේ ඉදිකර තිබුණු කඩ කාමර 40 ක් අළුත්වැඩියා කර හෝ නැවත භාවිතයට ගත හැකි තත්ත්වයකට පත් කර නොතිබුණි. | අදාළ වත්කම් අළුත්වැඩියා කර ආදායම් උත්පාදනය සඳහා යෙදවීමට කටයුතු කළ යුතුවේ. | මෙම කඩකාමරවල මාසික කඩ කුලී මුදල් ගෙවීම එක්සත් වෙළෙඳ සංගමයේ උපදෙස් මත බදුකරුවන් විසින් 2018 ඔක්තෝබර් මස සිට නවතා දමා ඇත. එයට හේතු වී ඇත්තේ මෙම කඩ කාමරවල අබලන් තත්ත්වය හා කඩ කාමරවල සින්නක්කර අයිතිය ඉල්ලා ගරු දිසා අධිකරණයේ නඩු පැවරීම යි. එම හිඟ කඩකුලී මුදල් අයකර ගැනීම සඳහා ගරු දිසා අධිකරණය වෙත කරුණු වාර්තාකර නෙරපීම් නියෝග ලබා ගැනීමට මේ වනවිට කටයුතු කරමින් පවතී. |

### 3.3.3 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.126,000 ක් වූ කටුකැලියාව ගව සාතකාකාරය පිහිටි ඉඩම සභාව වෙත පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි. | පවරාගැනීම් කඩිනමින් සිදුකිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ඉඩම පවරා ගැනීම සඳහා වර්ෂ ගණනාවක සිට මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ ලිපි ගනුදෙනු වී ඇති නමුත්, සභාව වෙත ඉඩම පවරාදීමට මේ වනතෙක් කටයුතු කර නොමැත. |